# ඔබ දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තෙක්ද?

**ඔබ,**

**දේශීය වශයෙන් හෝ විදේශීය රාජ්‍යයක් විසින් හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින් ප්‍රමුඛ රාජ්‍ය කර්තව්‍ය පවරා ඇති යම් පුද්ගලයකු, එනම්,**

- යම් රාජ්‍යයක හෝ රජයක ප්‍රධානියකු,
- දේශපාලන කටයුතු වල නිරත පුද්ගලයකු,
- රජයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු,
- අධිකරණ ක්ෂේත්‍රයේ ඉහළ නිලධරයකු,
- යුධ, නාවික, ගුවන් හමුදා හා පොලිසියේ ඉහළ නිලධරයකු,
- රජය සතු සංස්ථාවක, රජයේ හෝ ස්වාධීන ආයතනයක ජ්‍යෙෂ්ඨ විධායක නිලධරයකු (මධ්‍යම මට්ටමේ හෝ කනිෂ්ඨ මට්ටමේ නොවන) හෝ
- ඉහත සඳහන් කළ තැනැත්තකු ගේ සමීප පවුලේ සාමාජිකයකු හෝ ආශ්‍රිතයකු,

වේ නම්, මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් විසින් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ දී, ඔබ දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තෙක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

**ඔබ ඉහතින් දැක්වූ පුද්ගලයකු වන්නේ නම්, ඒ බව පහත දක්වා ඇති මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සමග ගනුදෙනු සිදු කිරීමේදී දැනුම් දිය යුතු වේ.**

## මූල්‍ය ආයතන

*උදා:*

- බලපත්‍රලාභී බැංකු
- බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
- කොටස් තැරැව්කාර සමාගම්
- මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්
- රක්ෂණ සමාගම්
- පරිසීමිත වෙළෙඳුන්

## නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්

*උදා:*

- කැසිනෝ
- නිශ්චල දේපල අනුයෝජිතයන්
- මැණික් හා ස්වර්ණාභරණ අලෙවිකරුවන්
- ගණකාධිකාරීවරුන්, නීතිඥවරුන්, නොතාරිස්වරුන් සහ වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන්
- භාර සහ සමාගම් සේවා සපයන්නන්

මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් විසින් තම ගනුදෙනුකරුවන් සමග ගනුදෙනු සිදු කරන විට පාරිභෝගිකයා හෝ ප්‍රතිලාභී හිමිකරු දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තෙක් ද යන්න තීරණය කිරීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ පාලන ක්‍රම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මෙය 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සහ 2018 අංක 01 දරන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති යටතේ ඇති අවශ්‍යතාවයකි.

එබැවින්, මේ සඳහා සියලුම මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්හි ගනුදෙනුකරුවන්ගේ සහයෝගය අපේක්ෂා කෙරේ.

**දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් පිළිබඳ වැඩි විස්තර සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද "2019 අංක 03 දරන දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් හඳුනාගැනීම සඳහා වූ මාර්ගෝපදේශ" වෙත යොමු වීමට QR කේතය ස්කෑන් කරන්න.**

**ඔබට වැඩිදුර විස්තර අවශ්‍ය නම්, මූල්‍ය බුද්ධි ඒකකය අමතන්න.**


මූල්‍ය බුද්ධි ඒකකය

நிதியியல் உளவறிதல் பிரிவு

FINANCIAL INTELLIGENCE UNIT

☎ 0112 477 125 | 0112 477 692 | @ fiu@cbsl.lk | www.fiusrilanka.gov.lk